ISSN-2706-0047

මැතිවරණ කොමිෂන් සභාව

2023 මැයි - සැප්තැම්බර් 7 වන වෙළුම 2 වන කලාපය

කතිරයේ බලය

2023 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

ශ්‍රීන් යාපා බොරලැස්ස මහතා
සහකාර මැතිවරණ කොමසාරිස් - ජාතික මැතිවරණ

රටෙහි සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපනය, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්ද බලය සහතික කර ඇත.පරමාධිපත්‍ය ජනතාව සතු බව, එය අන්සතු කළ නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත් එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි ය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්යය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2023 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව ඇත්තේ 2005.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ටය.)
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සාමාන්‍ය පදිංචිය තිබීම.
- ඡන්දහිමියෙකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිවීම සඳහා නුසුදුසුකම්
- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය විසින් තීරණය වී තිබීම.
- අවුරුදු 02ක සිරගතවීමට නියමවන වරදකට අධිකරණය මඟින් වරදකරුවෙකු වී මාස 06ක් හෝ ඊට වැඩි කාලයක් සිරගත වී සිටීම හෝ සිරගත වී සහ ඉන්පසු අවුරුදු 07ක කාලයක් ගතවී නොතිබීම.
- අල්ලස් චෝදනාවකට වරදකරුවෙකු වී අවුරුදු 07ක කාලයක් ගතවී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවෙකු කර තිබීම.
- මහජන ආයතන දූෂණ වැලැක්වීමේ ආඥා පනත යටතේ වරදකරුවෙක් වී තිබීම.

2023 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ප්‍රධාන නාමලේඛනය සකස් කිරීමට අදාළව මූලික කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින අතර එම නාමලේඛනය සහතික කිරීමේ කටයුතු 2023 ඔක්තෝම්බර් 31 දින වන විට අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

2023 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

පරිපූරක ඡන්දහිමි නාමලේඛනය	අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය	උපන් දිනය
2023(1)	2023.02.01 සිට 2023.05.31 දක්වා	2005.02.01 සිට 2005.05.31 දක්වා
2023(2)	2023.06.01 සිට 2023.09.30 දක්වා	2005.06.01 සිට 2005.09.30 දක්වා
2023(3)	2023.10.01 සිට 2024.01.31 දක්වා	2005.10.01 සිට 2006.01.31 දක්වා

2024 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

පරිපූරක ඡන්දහිමි නාමලේඛනය	අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය	උපන් දිනය
2024(1)	2024.02.01 සිට 2024.05.31 දක්වා	2006.02.01 සිට 2006.05.31 දක්වා
2024(2)	2024.06.01 සිට 2024.09.30 දක්වා	2006.06.01 සිට 2006.09.30 දක්වා
2024(3)	2024.10.01 සිට 2025.01.31 දක්වා	2006.10.01 සිට 2007.01.31 දක්වා

18 සම්පූර්ණ කළ විගස ඡන්ද බලය

වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබාදීම සඳහා නීති සම්පාදනය කර ඇත. ඒ අනුව පෙබරවාරි 01 සිට මැයි 31 දක්වා; ජුනි 01 සිට සැප්තැම්බර් 30 දක්වා; ඔක්තෝබර් 01 සිට ජනවාරි 31 දක්වා යන කාල පරිච්ඡේද තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කරන තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛන සෑම මාස 04කට වරක්ම සකස් කරනු ලබයි.

ඒ අනුව 2023.02.01 සිට 2025.01.31 දක්වා (වසර දෙකක කාලය සඳහා) වයස අවුරුදු 18 සම්පූර්ණ කරන යොවුන් පුරවැසියන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා තොරතුරු එක්රැස් කරනු ලැබීය. මේ සඳහා YC/2023 අකෘතිය භාවිතා කරන ලද අතර එමඟින් 2005.02.01 දින සිට 2007.01.31 දින දක්වා උපන් තැනැත්තන් විස්තර ලබාගන්නා ලදී.

ඒ අනුව 2023 වර්ෂයට අදාළව පළමු පරිපූරකය ලැයිස්තුව 2023.09.15 දින ද දෙවැනි පරිපූරක ලැයිස්තුව 2023.10.02 දින ද සහතික කිරීමට නියමිතය.

ඡන්දහිමි නාමලේඛනය පරීක්ෂා කිරීම සඳහා QR කේතයක් හඳුන්වාදීම

ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරීක්ෂා කිරීම සඳහා QR කේතයක් හඳුන්වාදිම සිදුකරන ලදි.

මෙම QR කේතය මඟින් ජනතාව හට තමන්ගේ ඡන්දහිමි නාමලේඛන තොරතුරු වඩාත් පහසුවෙන් පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදී ඇත.

මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව

මැතිවරණ කොට්ඨාසය හා පරිපාලන දිස්ත්‍රික්කය	ඡන්දහිමියන් සංඛ්‍යාව	
	2021	2022
කොළඹ	1,735,315	1,743,541
ගම්පහ	1,814,507	1,824,742
කළුතර	985,948	992,273
මහනුවර	1,151,796	1,159,147
මාතලේ	416,249	418,929
නුවරඑළිය	586,089	588,850
ගාල්ල	879,992	884,028
මාතර	667,904	672,218
හම්බන්තොට	503,184	506,368
යාපනය	572,446	577,718
යාපනය දිස්ත්‍රික්කය	476,792	480,900
කිලිනොච්චි දිස්ත්‍රික්කය	95,654	96,818
වන්නි	293,682	298,015
වවුනියාව දිස්ත්‍රික්කය	124,735	126,204
මන්නාරම දිස්ත්‍රික්කය	86,879	88,484
මුලතිව් දිස්ත්‍රික්කය	82,068	83,327
මඩකලපුව	427,125	433,346
දිගාමඩුල්ල	529,045	534,145
ත්‍රිකුණාමලය	297,946	301,908
කුරුණෑගල	1,375,457	1,385,703
පුත්තලම	637,009	643,279
අනුරාධපුර	710,248	717,482
පොළොන්නරුව	339,428	342,031
බදුල්ල	680,892	684,521
මොණරාගල	381,252	384,888
රත්නපුර	895,944	902,996
කෑගල්ල	694,188	696,269
මුළු එකතුව	**16,575,646**	**16,692,397**

ජෙරිමැන්ඩරින් මනින දර්ශක "කාර්යක්ෂමතා පරතරය"

ආචාර්ය ජයන්ත සේනාධීර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

සීමා නිර්ණයක සාධාරණත්වය සැලකීමේ දී ඉතා වැදගත් සංකල්පයක් වන ජෙරිමැන්ඩරින් පිළිබඳව ගියවර කලාපයෙන් හඳුන්වා දෙන ලදි. එහි දී කිසියම් සීමා නිර්ණයක ජෙරිමැන්ඩරින් තත්ත්වය මැන බැලීම සඳහා ප්‍රමාණාත්මක ක්‍රම, එනම් ගණිතමය දර්ශක හඳුන්වාදෙන බවට අපි පොරොන්දු වීමු. අද ලිපිය මගින් සිදු කරනු ලබන්නේ ඒ සඳහා වන වැදගත් දර්ශකයක් වන කාර්යක්ෂමතා පරතර ක්‍රමය (Efficiency gap method) හඳුන්වා දීමයි.

අවස්ථා කිහිපයක දී මතු වූ ජෙරිමැන්ඩරින් ප්‍රශ්නය නිසා එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණය, එය සාධාරණත්වයේ මූල ධර්මයට විශාල හානියක් බැවින් සීමා නිර්ණය සඳහා ප්‍රමිතිගත තත්ත්ව හඳුන්වා දීම අවධාරණයට ලක් කරන ලදි. ගැටලුව වූයේ ජෙරිමැන්ඩරින් සිදුව ඇති බව දකින්නට ලැබුන ද එය ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කිරීමට විධික්‍රම නැති වීමයි. වර්ෂ 2015 දී එස්. නිකලස් සහ එරික් මැක්ගී විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඇන්තනි කෙනඩි ගේ මාර්ගෝපදේශවලට අනුකූලව කාර්යක්ෂමතා පරතරය ලෙස අද හැඳින්වෙන සංඛ්‍යාත්මකව සරල දර්ශකය හඳුන්වා දෙන ලදී.

කාර්යක්ෂමතා පරතර ක්‍රමය

කාර්යක්ෂමතා පරතර ක්‍රමය සරලව හඳුන්වා දීම සඳහා අපි එය ප්‍රධාන පක්ෂ දෙකක මැතිවරණයක් සඳහා සීමා කරමු. මැතිවරණයට පෙර මැතිවරණ කොට්ඨාශය ආසන දෙකකට හෝ වැඩි ගණනකට සීමා නිර්ණය මගින් බෙදා වෙන් කරන්නේ යැයි සිතමු. මෙහි දී එක් එක් ආසන වෙන් කිරීමේ දී ආසන්න වශයෙන් ජනගහනය සමාන වන පරිදි බෙදන්නේ යැයි බලා පොරොත්තු වෙමු. එහි දී එක් එක් ආසනයේ කාර්යක්ෂමතා පරතර අගය මෙසේ අර්ථ දැක්විය හැකිය. "A පක්ෂයේ අපතේ යන ඡන්ද ප්‍රමාණය සහ B පක්ෂයේ අපතේ යන ඡන්ද ප්‍රමාණය අතර අන්තරය මුළු ඡන්ද ප්‍රමාණයට දරන අනුපාතය" කාර්යක්ෂමතා පරතරය ලෙස අර්ථ දැක්වේ. සමීකරණයක් ලෙස මෙය මෙසේ දක්වමු.

ආසනයක A පක්ෂයේ අපතේ යන ඡන්ද ප්‍රමාණය A_w

එම ආසනයේ B පක්ෂයේ අපතේ යන ඡන්ද ප්‍රමාණය B_w

මැතිවරණ කොට්ඨාශයේ මුළු වලංගු ඡන්ද ප්‍රමාණය = T

ආංශික කාර්යක්ෂමතා පරතරය (ආසනයට අදාලව) = $A_w - B_w / T$

සීමා නිර්ණයේ කාර්යක්ෂමතා පරතරය = ආසන සියල්ලේ ආංශික කාර්යක්ෂමතා පරතර එකතුව

මෙම දර්ශකය ඍණ අගයක් ගැනීමෙන් කියවෙන්නේ අදාල සීමා නිර්ණයේ වැඩි වාසිය දර්ශකයේ දකුණු පස මුලින් ඇති පක්ෂයට ඇති බවය. එය ධන අගයක් ගැනීමෙන් වැඩි වාසිය දර්ශකයේ දකුණු පස පසුව ඇති පක්ෂයට ඈත. දර්ශකයේ අගය ධන හෝ ඍණ අගයන් සහිතව බින්දුවට ආසන්න වන්නේ නම් අදාල සීමා නිර්ණයේ ජෙරිමැන්ඩරින් අවම බව කියැවේ. අනෙක් අතට කාර්යක්ෂමතා පරතරය ධන හෝ ඍණ අගයන් සහිතව විශාල වන්නේ නම් එම සීමා නිර්ණයේ ජෙරිමැන්ඩරින් විශාල වශයෙන් (කාර්යක්ෂමතා පරතරයේ මාපාංකයට සමානුපාතිකව) සිදුව ඇත. කෙසේ වුව ද කාර්යක්ෂමතා පරතරය සාමාන්‍යයෙන් ප්‍රතිශතයක් ලෙස දක්වනු ලැබේ. කාර්යක්ෂමතා පරතරය බින්දුව වන සීමා නිර්ණ ප්‍රායෝගිකව නොපවතින අතර දැනට පිළිගත් සම්මතය අනුව එම අගය -8% හා +8% අතර නම් එම සීමා නිර්ණය පිළිගත හැකි මට්ටමක පවතින්නේ යැයි සලකනු ලැබේ.

දර්ශකය තේරුම් ගැනීම සඳහා අපතේ යන ඡන්ද ප්‍රමාණ යනු මොනවාදැයි තේරුම් ගත යුතු ය. පක්ෂ දෙකක් පමණක් සහභාගී වන මැතිවරණයක දී කේවල ක්‍රමය යටතේ කිසියම් ආසනයක ඡන්දයක් දිනීමට දිනන පක්ෂය විසින් මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් හරි අඩක් සහ තවත් එක ඡන්දයක් ලබා ගත යුතු ය. දිනන පක්ෂයට මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් හරි අඩක් සහ තවත් එකකට වැඩියෙන් ලැබෙන ඡන්ද එම පක්ෂයේ අපතේ යන ඡන්ද ලෙස සලකනු ලැබේ. පරාජිත පක්ෂයේ සියලුම ඡන්ද පරාජිත පක්ෂයේ අපතේ ගිය ඡන්ද හැටියට සලකනු ලැබේ.

උදාහරණ වශයෙන් ආසනයක මුළු වලංගු ඡන්ද සංඛ්‍යාව 60 ක් වන ආසනයක ඡන්ද විමසීමක දී A පක්ෂය සහ B පක්ෂය පිළිවෙලින් ඡන්ද 17 සහ 43 බැගින් ලබා ගත්තේ යැයි සිතමු. මෙහි පරාජිත පක්ෂය වන A පක්ෂයේ අපතේ ගිය ඡන්ද සංඛ්‍යාව 17 ක් වන අතර ජයගත් B පක්ෂයේ අපතේ ගිය ඡන්ද සංඛ්‍යාව 43 න් 60 න් බාගයට තව එකක් වැඩි සංඛ්‍යාව වන 31 අඩු කිරීමෙන් ලැබෙන අගය, එනම් 12 වේ.

ගියවර කලාපයේ අපගේ උදාහරණය මගින් පළාත් පාලන කොට්ඨාශයක් ආසන තුනකට බෙදන පරිදි වන සීමා නිර්ණයන් සලකා බලන ලදී. එහිදී (a), (b) සහ (c) යන සීමා නිර්ණ විධි තුන සලකා බැලිණි. එක් ආසනයක් ග්‍රාම නිලධාරී වසම් 05 කින් සමන්විත වේ. අපේ පහසුව තකා

ග්‍රාම නිලධාරී වසමක් එක් ඡන්දයකින් සමන්විත වන්නේ යැයි සිතමු. (මෙය ඡන්ද සියයකින්, දහසකින් ආදී ලෙස සැදුනු ඒකකයක් ලෙස ගත හැකි ය.)



(a) (b) (c)

දැන් අපි ඉහත කාර්යක්ෂමතා පරතර සමීකරණය එක් එක් සීමා නිර්ණයේ තත්ත්වය සොයා බැලීම සඳහා යොදවමු. (a) සීමා නිර්ණයේ වම් පස සිට දකුණු පසට සිරස්ව පිළිවෙලින් ඇති ආසන 1,2 හා 3 ලෙස නම් කරමු.

ආසන අංකය	රතු පක්ෂයේ ඡන්ද	නිල් පක්ෂයේ ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද	නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද - නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද
1	2	3	2	0	2
2	2	3	2	0	2
3	2	3	2	0	2

රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද R_w ලෙසද, නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද B_w ලෙසද ගෙන පළාත් පාලන මැතිවරණ කොට්ඨාශයේ මුළු ඡන්ද සංඛ්‍යාව 15 බැවින් ආසනයක් සඳහා ආංශික කාර්යක්ෂමතා පරතරය $(R_w)B_w)/15$ මගින් ගණනය කල හැකි ය. ඒ අනුව අංක 1, අංක 2 හා අංක 3 ආසන සඳහා අගයන් පිළිවෙලින් 2/15, 2/15 හා 2/15 වේ. ඒ අනුව සීමා නිර්ණයේ කාර්යක්ෂමතා පරතරය ලබාගැනීමට මේ සංඛ්‍යා තුන එකතු කර ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතු ය. එම අගය 40% කි.

දැන් අප (b) සීමා නිර්ණයේ කාර්යක්ෂමතා පරතරය ලබාගැනීමට උඩ සිට පහලට පිළිවෙලින් ඇති ආසන 1,2 හා 3 ලෙස නම් කරමු.

ආසන අංකය	රතු පක්ෂයේ ඡන්ද	නිල් පක්ෂයේ ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද	නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද - නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද
1	2	3	2	0	2
2	3	2	0	2	*2
3	1	4	1	1	0

මේ අනුව මෙම (b) සීමා නිර්ණයේ දී එක් එක් ආසනයන්ට අදාල ආංශික ගණනයන් පිලිවෙලින් 2/15, -2/15 සහ 0/15 වේ. ඒ අනුව කාර්යක්ෂමතා පරතරය මේ සියල්ලෙහි එකතුව වන 0% කි.

එලෙසම (c) සීමා නිර්ණයේ උඩ සිට පහලට ඇති ආසන පිළිවෙලින් 1,2 හා 3 ලෙස නම් කරමු.

ආසන අංකය	රතු පක්ෂයේ ඡන්ද	නිල් පක්ෂයේ ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද	නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද	රතු පක්ෂයේ අපතේ ගිය ඡන්ද - නිල් පක්ෂයේ අපතේ ගිය ඡන්ද
1	3	2	0	2	*2
2	3	2	0	2	*2
3	0	5	0	2	*2

ඒ අනුව මෙම සීමා නිර්ණයේ කාර්යක්ෂමතා පරතරය -40% කි. අවසාන වශයෙන් (a), (b) හා (c) සීමා නිර්ණයන්හි දී කාර්යක්ෂමතා පරතර පිළිවෙලින් 40% 0% හා -40% බව පෙන්වා දෙන ලදී.

කෙසේ වුව ද අප මෙහි දී පෙන්වා දුන්නේ කාර්යක්ෂමතා පරතර දර්ශකයේ සරලම අවස්ථාවක භාවිතයක් පමණි. මෙම දර්ශකයේ වඩාත් පුළුල් භාවිතයත් සමඟ වඩා සියුම් අර්ථකථන ලබා දිය හැකිවාක් මෙන්ම එහි දුර්වලතා ද හඳුනා ගත හැකි ය.

කාර්යක්ෂමතා පරතර දර්ශකයේ දුබලතා

කාර්යක්ෂමතා පරතරය ජෙරිමැන්ඩරින් මැන බැලීම සඳහා වන විශිෂ්ට දර්ශකයක් වන්නා සේම එයටම ආවේණික දුබලතා ද එහි අන්තර් ගත වේ. සීමා නිර්ණය මගින් මැතිවරණ කොට්ඨාශයක් බෙදනු ලබන්නේ ආසන අඩු සංඛ්‍යාවකට නම් එවැනි අවස්ථාවකට එය සුදුසු නොවේ. එමෙන්ම තනි පක්ෂයක් මැතිවරණ කොට්ඨාශයේ 79% කට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබන්නේ නම් කාර්යක්ෂමතා පරතරය මගින් දෙනු ලබන නිගමන සුදුසු නොවේ.

ආශ්‍රිත ග්‍රන්ථ හා අන්තර්ජාල සබැඳි

- https://en.wikipedia.org/wiki/Gerrymandering
- *Benjamin Plener Cover,* Quantifying Political Gerrymandering: An Evaluation of the Efficiency Gap Proposal, 70 Stanford Law Review.
- https://arxiv.org/abs/1705.10812

ආබාධ සහිත සියළුම පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය

ටිකිරි කුමාර ජයවර්ධන මහතා
සංවර්ධන නිලධාරී - මැතිවරණ කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහනම වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව 2015 වර්ෂයේ දී මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. එම ප්‍රථම කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමත් සමඟ සුදුසුකම් ලත් සියලූ පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී. එම සංකල්පයට අනුව ආබාධ සහිත ප්‍රජාව ඡන්ද විමසීම්වල දී මුහුණපාන අපහසුතාවන්වලට නව ප්‍රවේශයකින් විසදුම් සෙවීමත්, ඔවුන්ගේ දේශපාලන සාක්ෂරතාව ඉහළ නැංවීමටත් සහ ඔවුන් සියලූදෙනා මැතිවරණ ප්‍රවාහයට සම්බන්ධ කර ගැනීම සඳහාත් පුළුල් අවධානයක් යොමු කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ග සැලසුමට අනුව කිසිවෙක් අත්නොහැරුණු මැතිවරණ ක්‍රියාවලිය යථාර්තයක් බවට පත් කිරීම වෙනුවෙන් වූ වැඩසටහන්, වැඩමුළු, විශේෂ ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කරමින් පවති. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලිය තුළට සක්‍රීය හා ඵලදායි ආකාරයෙන් සහභාගී කර ගැනීම සඳහා ඔවුන් මුහුණපාන අපහසුතාවන් විධිමත් ක්‍රමවේද ඔස්සේ හඳුනා ගනිමින් අන්තර්කරණ මූලධර්මයන්ට අනුකූලවන පරිදි ඒ සඳහා අවශ්‍ය අනුවර්තන පහසුකම් හඳුන්වා දෙමින් හා එම ප්‍රජාව සමඟ සමීප වෙමින් ඒකරාශී වෙමින් විශේෂ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වේ.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 29 වන වගන්තිය අනුව සමාජ සහභාගීත්වය සඳහා ඇති අයිතිය තහවුරු කරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රාජ්‍ය පාර්ශ්වයේ වගකීම බව පෙන්වා දී ඇත. තවද මැතිවරණ කොමිෂන් සභාවේ 2017- 2020 හා 2022 - 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලසුම් තුළ ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලිය තුළට බාධාවකින් තොර ව ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන පරිච්ඡේදයේ ඡන්ද බලය, ඡන්ද විමසීම හා මැතිවරණය යටතේ 93 වන ව්‍යවස්ථාව අනුව, "ජනරජයේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගැනීම සඳහා ද, ජනමත විචාරණවල දී ද, ඡන්දය දීම නිදහස්ව ද, සමානව ද, රහසේ ද විය යුත්තේ ය." යන්න සඳහන් කර ඇත.

ඒ අනුව පසුගිය වර්ෂ කිහිපය තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කිරීම වෙනුවෙන් එම ප්‍රජාව නියෝජනය වන සංවිධානවල සාමාජිකයන්ගේ සහාය ඇතිව සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු මතු දක්වා ඇත.

දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්ටෙන්සිල් රාමුව

එසේ වුව ද දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් අන් අයකුගේ සහාය ඇතිව ඡන්දය සළකුණු කිරීම නිසා ඡන්දය සළකුණු කිරීමේ දී ඔවුන්ගේ රහස්‍යභාවය ආරක්ෂා නොවන බැවින් එයට විකල්ප විසඳුමක් ලෙස මැතිවරණ කොමිෂන්



සභාව විසින් ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්ටෙන්සිල් රාමුව හඳුන්වා දෙන ලදී. නියමු ව්‍යාපෘතියක් ලෙස 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 10ක මෙම ස්ටෙන්සිල් රාමුව භාවිත කරමින් දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට ඡන්දය සළකුණු කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. ඒ තුළින් ලත් සාර්ථක ප්‍රතිඵල සමඟ මෙය තවත් වැඩිදියුණු කිරීම සඳහා බස්නාහිර පළාත, උතුරු පළාත සහ නැගෙනහිර පළාත්වල දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීම සිදු කරන ලදී. ඒ අනුව ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර සමඟ එය වැඩිදියුණු කර ඇති අතර ඒ පිළිබඳ දැනුම්වත් කිරීම සහ ස්ටෙන්සිල් රාමුව භාවිත කර ඡන්දය සළකුණු කිරීමට දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් පුහුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරීමට සැලසුම් කර ඇති බැවින් ඉදිරි ඡන්ද විමසීම්වල දී දාශ්‍යාබාධිත

තැනැත්තන්ට අන් අයකුගේ සහාය නොමැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කොට ඇති පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශ සැලසෙනු ඇත.

මැතිවරණ රාජකාරි නියුතු නිලධාරීන් සඳහා සංඥා භාෂාව පිළිබඳ මූලික දැනුම ලබාදීම

බිහිරි තැනැත්තන් සහ සන්නිවේදන අපහසුතා සහිත ශ්‍රවණාබාධ සහිත තැනැත්තන්ට ඡන්ද පොළ තුළ දී හා මැතිවරණ ක්‍රියාවලිය තුළ දී සංඥා භාෂා සන්නිවේදන පහසුකම් නොමැති වීම මත එකී ප්‍රජාවට බාධක මතුව ඇති බව හා විශේෂයෙන්ම ඡන්ද මධ්‍යස්ථාන තුළ දී ශ්‍රවණාබාධ සහිත තැනැත්තන් අපහසුතාවන්ට පත් වන බවත්, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කොට ඇත. එකී පුද්ගල සංවිධාන වෙතින් ද මේ පිළිබඳව විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් වී තිබේ.

ඒ අනුව මෙම පුහුණුව පාඨමාලාවක් ලෙස සැලසුම් කළ අතර දින දෙකක ප්‍රායෝගික පුහුණුවෙන් පසු පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වන නිලධාරීන්, සංඥා භාෂා පරිවර්තකයින් හා බිහිරි තැනැත්තන් දිස්ත්‍රික්ක මට්ටමින් සංඥා භාෂාව පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

මෙම මූලික පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට අනුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සංඥා භාෂාව සන්නිවේදනය කළ හැකි නිලධාරීන් දෙදෙනෙකු පුහුණු කිරීම, දිස්ත්‍රික්කය තුළ මැතිවරණ රාජකාරී සඳහා සම්බන්ධ කර ගන්නා රාජ්‍ය නිලධාරීන් හට සංඥා භාෂා මූලික සන්නිවේදන පිළිබඳ පුහුණු කළ හැකි නිලධාරීන් දෙදෙනෙකු, සංඥා භාෂා පරිවර්තකයකු හා බිහිරි තැනැත්තන් දෙදෙනෙකු පුහුණු කිරීම සිදු කර ඇත.

තවද මෙම පුහුණු වැඩසටහන පැවැත්වීම තුළින්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා බිහිරි තැනැත්තන් අතර සහසම්බන්ධතාව වර්ධනය කිරීම හා සංඥා භාෂා පරිවර්තකයකු සම්බන්ධ කිරීමට හැකි වන අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය තුළ ආබාධ සහිත ඡන්ද හිමියන්ගේ කේන්ද්‍රීය ඒකකය ස්ථාපිත කිරීම සඳහා බිහිරි තැනැත්තන් සහ සංඥා භාෂා පරිවර්තකයන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. මැතිවරණ ක්‍රියාවලිය තුළ ඒ ඒ දිස්ත්‍රික්ක මට්ටමින් බිහිරි ඡන්ද හිමියන්ට ඇති ගැටලු විසඳාලීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික පදනම මේ හරහා සිදු වන අතර ඡන්ද හිමියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුළට සහ මැතිවරණ ක්‍රියාවලියට අදාළ වැඩසටහන්වල දී සංඥා භාෂා පරිවර්තකයින් සම්බන්ධ කර ගැනීමට හැකියාව ලැබේ.

මෙයට විකල්ප විසඳුම ලෙස ඡන්ද මධ්‍යස්ථානවල රාජකාරී කටයුතුවල නිතර වන නිලධාරීන් සඳහා සංඥා භාෂාව පිළිබඳ මූලික පුහුණුවක් ලබා දීම සුදුසු බව බිහිරි තැනැත්තන්ගේ සංවිධාන විසින් යෝජනා කරන ලදී. මේ පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව විශේෂ අවධානයක් යොමු කරමින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන් සංඥා භාෂා පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමට වැඩසටහනක් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. බිහිරි ප්‍රජාව ඡන්දය ප්‍රකාශ කරනු ලබන ඡන්ද මධ්‍යස්ථාන පූර්වයෙන් හඳුනාගෙන එම ඡන්ද මධ්‍යස්ථානවල රාජකාරී සඳහා යෙදවීමට අපේක්ෂිත නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු පුහුණු කරවීම මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනේ මුඛ්‍ය අරමුණ වේ.

බිහිරි තැනැත්තන්ගේ සන්නිවේදන බාධාව ඉවත් කිරීම සහ ඔවුන් හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සමඟ ඇති අන්තර් සම්බන්ධතාව වැඩිදියුණු වීම මෙන් ම ඡන්ද පොළ තුළ දී බිහිරි තැනැත්තන්ට සිදු වන සන්නිවේදන බාධාව ඉවත් වීම මේ තුළින් සිදු වන වැදගත් ප්‍රවේශයන් ලෙස පෙන්වා දිය හැකි ය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර ආයතනය (IFES) සහ ශ්‍රී ලංකා බිහිරි වුවන්ගේ මධ්‍යම සම්මේලනය (SLCFD) මේ සඳහා පහසුකම් සම්පාදනය කරන ලදී. දැනට සියලුම දිස්ත්‍රික් කාර්යාලවල පුහුණුකරුවන් පුහුණු කිරීමේ නිලධාරීන් සිටින අතර මෙම පුහුණු වැඩසටහනට සම්බන්ධ වී ප්‍රායෝගික පරීක්ෂණය සමත් සියලූ දෙනා වෙත 2023 සැප් 25

වන දින පැවති ජාත්‍යන්තර බිහිරි දින සැමරුම් ජාතික උත්සවයට සමගාමීව සහතික පත්‍ර ප්‍රදානය සිදු කරන ලදී.

ආබාධ සහිත තැනැත්තන් සඳහා හඳුනා ගැනීමේ විශේෂිත කාඩ්පතක් නිකුත් කිරීම.

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ ලබා දී ඇති පහසුකම් වන ඡන්දය සලකුණු කිරීමේ දී සහායකයකු කැටුව යාම සහ ඡන්ද පොළ පරිශ්‍රයට වාහනයක් රැගෙන යාමට අවසර ලබා ගැනීමේ දී ඇති ක්‍රියාවලිය ප්‍රායෝගිකව ආබාධ සහිත තැනැත්තන්ට අපහසු කටයුත්තක් බවට පත්වී ඇත.



එක් එක් ඡන්ද විමසීම සඳහා වෙන් වෙන්ව ගත යුතුව පවත්නා වෛද්‍ය වාර්තාව වෙනුවට මේ සඳහා එක් අවස්ථාවක දී පමණක් වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීම ප්‍රමාණවත් බව මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති අතර ආබාධිත පුරවැසියන් ඡන්ද විමසීම්වලදී මුහුණපාන ගැටළු යම්තාක් දුරට අවම කර වීමට හේතුවක් වී ඇත.

ඒ අනුව පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා ඔවුන්ගේ මනාපය පරිදි ආබාධිතභාවය හඳුනා ගැනීම සඳහා වෛද්‍ය සහිතකයේ ආබාධිතභාවය පිළිබඳ තොරතුරු සහ ඡායාරූපය ඇතුළත් විශේෂ හඳුනාගැනීමේ කාඩ් පතක් නිකුත් කිරීම වඩාත් සුදුසු බව යෝජනා වී ඇත. මැතිවරණ කොමිෂන් සභාව ඒ අනුව ඉදිරි කටයුතු සැලසුම් කරමින් පවතී.

ඡන්දය සලකුණු කිරීමේ දී පිළිගත් හැඳුනුම්පත සමඟ ආබාධ සහිත තැනැත්තකු හට මෙම හැඳුනුම්පත ද ඉදිරිපත් කළ හැකි අතර එමගින් ඡන්ද පොළ තුළ දී ඔහුට හෝ ඇයට අවශ්‍ය පහසුකම් කුමක් ද යන්න පිළිබඳ ඡන්ද පොළ රාජකාරි නියුතු නිලධාරීන්ට පහසුවෙන් හඳුනා ගත හැකිවේ. ඡන්ද පොළ තුළට ඇතුළු වීමේ දී ආරක්ෂක නිලධාරීන්ට ආබාධ සහිත තැනැත්තකු පහසුවෙන් හඳුනා ගත හැකි වීම හා ඔහු හෝ අවශ්‍ය සේවාව සඳහා කඩිනමින් මැදිහත්වී බාධාවකින් තොරව නිදහසේ ඡන්දය සළකුණු කිරීමට පරිසරයක් සකස් කර දීම ද මෙමඟින් අපේක්ෂා කෙරේ. බාහිරින් හඳුනා ගත නොහැකි ආබාධ සහිත තත්ත්ව (Invisible disabilities) (බිහිරිභාවය, ස්නායු හෝ ජානමය හේතු නිසා ඇති වන ආබාධ, ශරීර අභ්‍යන්තරයේ ඇති ආබාධ සහිතභාවය, කෘතිම පාද හෝ කැලිෆර් ආදි භාවිත කරන තැනැත්තන් ආදි.) පහසුවෙන් හඳුනා ගැනීම තුළින් ඔවුනට ඡන්ද පොළ තුළ දී සිදුවන අපහසුතාවන් වළක්වා ගත හැකිවේ. එවිට මැතිවරණ හෝ ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවේ දී ඡන්ද නිලධාරීන්ට ආබාධ සහිත ඡන්දදායකයින් සඳහා අවශ්‍ය සේවා කළමනාකරණය ද මෙමඟින් පහසු වේ.

මෙම විශේෂ හැඳුනුම්පත පූර්ණ හා ස්ථිර ආබාධ සහිත තැනැත්තන් සඳහා පමණක් නිකුත් කරන බැවින් ජීවිත කාලය තුළ දී පැවැත්වෙන සෑම මැතිවරණයක දී ම භාවිත කළ හැකි වීමත්, සිය ආබාධ සහිත තත්ත්වය පිළිබඳව ඡන්ද පොළ තුළට පැමිණෙන අවස්ථාවේ දී ම නිලධාරීන් දැනුම්වත් කළ හැකි බැවින් අපහසුතාවයකින් තොරව ආත්ම අභිමානයෙන් යුතු ව ඡන්දය සලකුණු කිරීමට හැකි වීමත්, ඡන්ද පරිශ්‍රය තුළ වාහනය රැගෙන යාම හෝ සහායකයකු කැටුව යාම සඳහා අවශ්‍ය පහසුකම් බාධාවකින් තොර ව ලබා ගැනීමට හැකි වීමත් ආබාධ සහිත තැනැත්තන්ට මේ තුළින් සිදුවන ප්‍රයෝජන ලෙස පෙන්වා දිය හැකි ය.

දැනට මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් දිස්ත්‍රික්ක 10ක ක්‍රියාත්මක කරන අතර ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ සහ පැෆරල් සංවිධානය මේ සඳහා සහයෝගය ලබා දෙනු ලැබේ.

ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රවේශ පහසුකම් සකස් කිරීම.

ඡන්ද මධ්‍යස්ථානවල ආබාධිත ප්‍රවේශ පහසුකම් සහතික කිරීම පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව විසින් අවස්ථා ගණනාවක දී මැදිහත් වීම් සිදු කර ඇත. ඒ අනුව 2017 වර්ෂයේ දී ජනාධිපති කාර්යාලයේ සංවර්ධන සහ විශේෂ ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 80.7ක් වැය කරමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 23ක, බදුල්ල දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන

ඡන්ද මධ්‍යස්ථානවල ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සකස් කිරීම පිළිබඳව සොයා බැලීම

10ක, මොණරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 15ක, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 6ක් වශයෙන් දිස්ත්‍රික හතරක ඡන්ද මධ්‍යස්ථාන 54ක ආබාධිත ප්‍රවේශ මාර්ග සකස් කිරීමට මැදිහත් වී තිබේ. තවද 2019 වර්ෂයේ දී ඡන්ද මධ්‍යස්ථානවල ආබාධිත ප්‍රවේශ පහසුකම් සකස් කිරීම හා ප්‍රවේශ ගැටලු වෙනුවෙන් මැදිහත්විය යුතු ආකාරය පිළිබඳ අධ්‍යයනයක් කිරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඡන්ද මධ්‍යස්ථාන 64ක ප්‍රවේශ පහසුකම් පිළිබඳව විගණනයක් සිදු කරන ලදි. මෙම ප්‍රවේශ පහසුකම් විගණනය මඟින් ලබා ගන්නා ලද දත්ත අනුව ඡන්ද මධ්‍යස්ථානවල භෞතික ප්‍රවේශ ගැටලුව නිරාකරණය කිරීම සඳහා විකල්ප විසඳුම් සකස් කරමින් පවතී.

තවද ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ (DOCF) සමඟ 2023 ජූලි 13 වන දින මාතලේ මහනගර සභා සීමාව තුළ සිදු කරන ලද ප්‍රවේශ පහසුකම් විගණන අනුව ඡන්ද මධ්‍යස්ථාන 10ක ප්‍රවේශ පහසුකම් සකස් කර ඒවා ආදර්ශ ඡන්ද මධ්‍යස්ථාන ලෙස හඳුන්වාදීමට සැලසුම් කරමින් පවතී.

මීට අමතරව මැතිවරණ කාලසීමාව තුළ ඡන්ද මධ්‍යස්ථාන නවීකරණය කටයුතු සිදුකිරීමේ දී ඡන්ද මධ්‍යස්ථානවල ආබාධිත ප්‍රවේශ පහසුකම් සකස් කිරීමට වැඩි අවධානයක් යොමු කොට ඇත.

ආබාධ සහිත ඡන්දහිමියන්ගේ දත්ත රැස් කිරීම සහ අවශ්‍ය පහසුකම් කළමනාකරණය කිරීම.

ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු කළමනාකරණය කිරීම සහ ඔවුන්ට ගැලපෙන අනුවර්තන පහසුකම් ලබා දීම වඩාත් පහසුවෙන් කරගැනීම සඳහා ඔවුන් පිළිබඳ සම්පූර්ණ එසේම නිවැරදි දත්ත පද්ධතියක් නොමැති වීම විශාල ගැටලුවක් වී තිබේ. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් අන්තර්කරණය සඳහා වූ තාක්ෂණික කමිටුවේ (DIESL-TWG) සහ මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර ආයතනයේ (IFES) සහයෝගය ඇතිව සංඛ්‍යා දත්ත රැස් කිරීමේ ආකෘති පත්‍රයක් සකස් කරන ලදි. ඒ සඳහා Washington Group Set of Questions තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදය යොදා ගන්නා ලදි (www.washingtongroup-disability.com).

ඒ අනුව සකස් කර ගන්නා ලද තොරතුරු රැස් කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේ නියමු ව්‍යාපෘති කිහිපයක් කිලිනොච්චිය, යටියන්තොට, කොත්මලේ සහ වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිදු කරන ලදි.

එම සමීක්ෂණයට අනුව ඡන්ද මධ්‍යස්ථානය තුළ ආබාධ සහිත තැනැත්තන්ට අවශ්‍ය පහසුකරණය කුමක් ද යන්න පිළිබඳ විමසා බලන ලදි. එහිදී හඳුනාගන්නා ලද මූලික අවශ්‍යතාවයන් මතු දැක්වේ.

1. ඡන්ද මධ්‍යස්ථානය තුළ රෝද පුටු භාවිත කිරීමට වීම.
2. ඡන්ද මධ්‍යස්ථානය තුළ රෝද පුටු නොවන වෙනත් චලන ආධාරක භාවිත කිරීමට අවශ්‍ය වීම.
3. ඡන්දය ප්‍රකාශ කරන කුටිය සහ ඡන්ද පෙට්ටිය අඩු උස මට්ටමක තිබීම අවශ්‍ය වීම.
4. බ්‍රේල් මාධ්‍ය භාවිතාව.
5. බ්‍රේල් නොමැති වෙනත් දෘශ්‍යය නොවන ආධාරක තාක්ෂණ සහාය අවශ්‍ය වීම.
6. අකුරු විශාල කර පෙන්වීමේ උපකරණවල අවශ්‍යතාව.
7. සෙමින් පැහැදිලි කර දීම අවශ්‍යතාව.
8. රූප මාධ්‍ය තොරතුරු අවශ්‍ය වීම.
9. සංඥා භාෂා පරිවර්තකයකුගේ සහාය අවශ්‍ය වීම.
10. ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සාහායකයකු අවශ්‍ය වීම.
11. ඡන්ද මධ්‍යස්ථානයට පැමිණීමට සාහායකු අවශ්‍යතාව.
12. ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රයට පැමිණීමට ප්‍රවාහන පහසුකම්වල අවශ්‍යතාව.

ආබාධ සහිත ප්‍රජාවට බාධාවකින් තොරව ඡන්දය සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හඳුනා ගනිමින් ඒවා කළමනාකරණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් අවශ්‍ය මැදිහත් වීම සිදු කිරීමට මෙම දත්ත රැස්කිරීම තුළින් අපේක්ෂා කරන අතර එකී අවශ්‍යතා ඒ සඳහා ඉල්ලුම් කිරීමට 2023 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන අවස්ථාවේ දී පහසුකම් සලසා දී ඇති අතර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද ඒ සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කර ඇත.

ආබාධ සහිත පුරවැසියන් සියලු දෙනා ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් සාධනීය තිරසාර පියවර රැසක් ගෙන ඇත. ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආබාධ සහිත පුද්ගල සංවිධාන සහ ඔවුන් නියෝජනය කරනු ලබන සෙසු සංවිධාන මෙන්ම මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර ආයතනය (IFES), පැෆරල් සංවිධානය වැනි මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල සහයෝගය ද ලැබී තිබේ. මෙමඟින් සමස්ත ආබාධ සහිත තැනැත්තන්ට බාධාවකින් තොර ව මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ වෙමින් ඔවුන්ගේ දේශපාලන සහ සමාජ සහභාගීත්වය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මැතිවරණ කොමිෂන් සභාවේ මෙම ක්‍රියාවලිය සමස්ත ආබාධිත ප්‍රජාවගේ මහත් පැසසුමට ලක්ව ඇති බව ද නොපැකිලිව ප්‍රකාශ කළ යුතුව පවතී.

ඡන්ද බලය - සන්තාපය හා ප්‍රබලතාව

ලක්වැසි කඳුරට දමිළ ජනතාවගේ ඡන්ද බල පුරාණය

මයිල්වාහනම් තිලකරාජා මහතා
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ යටත්විජිතයක් බවට පත්වීමෙන් අනතුරුව 1830 සිට 1930 දක්වා වූ ශත වර්ෂයක කාල පරිච්ඡේදය තුළ ලංකාවේ වැවිලි ප්‍රදේශවල වැඩ කිරීමට ක්‍රම ක්‍රමයෙන් දකුණු ඉන්දියාවේ සිට ගෙන්වා ගනු ලැබූ පිරිස හඳුන්වනු ලබනුයේ 'ඉන්දීය දමිළ ප්‍රජාව' වශයෙනි. ශ්‍රී ලංකාවේ ජනගහණය පිළිබඳ සංගණනයේ දී වාර්ගික වශයෙන් සිංහල (1), ලංකා දමිළ (2), ලංකා යෝනක (3) ආදී වශයෙන් බලන විට මෙම 'ඉන්දීය දමිළ' ජනතාවට සිව් වන (4) ස්ථානය හිමි වේ. වැවිලි ප්‍රදේශවල මෙන්ම ඉන් පරිබාහිරව වෙසෙන ඔවුන්ගේ සංඛ්‍යාව සමස්තයක් වශයෙන් ලක්ෂ 15ක් වන බව අනුමාන කරනු ලැබුව ද, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිල ලේඛනවල එම සංඛ්‍යාව දැක්වෙනුයේ, ලක්ෂ 8ක් වශයෙනි.

ඉන්දීය අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු සහ ශ්‍රී ලංකාවේ අගමැති කොතලාවල

1931 දී සර්වජන ඡන්ද බලය ප්‍රදානය කළ අවස්ථාවේ දී ලාංකික පුරවැසියෙකුට හිමි තත්ත්වය ද ඡන්ද බලය ද ඔවුන්ට හිමිවිය. එසේම නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තුවේ (1948) එම ප්‍රජාවගේ නියෝජනය හතක්ව (7) පැවතිණි. එසේ වුවත්, 1948 අංක 18 දරන, ලංකා පුරවැසි පනත මගින් ඉන්දීය සම්භවයක් සහිත දමිළ ජනතාවගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි කරන ලදි. (Act passed on 15th November 1948 and withheld citizenship from the Indian Tamil Community).

පුරවැසිභාවය අහිමි පුද්ගලයන්ට ලංකාව තුළ ඡන්ද බලය ද නොමැති බැවින් සර්වජන ඡන්ද බලය හිමිව තිබූ ජනතාවගේ එම ඡන්ද බලය උදුරා ගැනීමට 1949 අංක 48 දරන, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනත මඟින් සිදු වී තිබේ.

එදා පටන් අඛණ්ඩ අරගල, රාජ්‍ය තාන්ත්‍රික කටයුතු හා ඉල්ලීම් ආදිය හරහා දශක තුනකට අධික කාලයකට පසුව ලක්වාසී ඉන්දීය දමිළ ජනතාවටත් ක්‍රමිකව ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබාගැනීමට හැකි විය.

1949 අංක 3 දරන, ඉන්දියා - පකිස්තාන පදිංචිකරුවන්ගේ පුරවැසි පනත මගින් කොන්දේසි සහිතව පුරවැසිභාවය සඳහා අයදුම්පත් කැඳවන ලදි. පකිස්තානුවන්ට හා ඉන්දීය ප්‍රභූ පැලැන්තියට නියමිත පරිදි සාක්ෂි ඉදිරිපත් කර යළිත් අයදුම් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාගැනීමට හැකිවූ නමුදු, සිය මුතුන්මිත්තන් ශ්‍රී ලංකාවේ ජීවත් වූ බව සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි නොමැතිවීම හේතුවෙන් මෙම පනත මගින් ශ්‍රමිකයන් මංමුලාවට පත්වීමට සිදුවිය. තිබුණු තත්ත්වය උදුරාගෙන යළිත් වරක් එය ලබාදීමට එම පනත මගින් කොන්දේසි පනවන ලදි. ලක්ෂ 9 කට අධික පිරිසක් "අදේශික පුද්ගලයෝ" (stateless) බවට පත්වූහ.

1954 දී එවක ඉන්දීය අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු සහ ශ්‍රී ලංකාවේ අගමැති කොතලාවල යන මහත්වරුන් අතර ඉන්දු - ලංකා පුරවැසිභාවය පිළිබද ගිවිසුම අත්සන් තබන ලදි. එම අවස්ථාවේ දී පනස් දහසක් පමණ පිරිසක් ඒ සඳහා අයදුම් කළ ද පුරවැසිභාවය හිමිවූයේ තුන් දහසක් වැනි පිරිසකට පමණි. එපමණට එය සංකීර්ණ විය.

1964 දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ලාල් බහදූර් ශාස්ත්‍රී අතර 'ඉන්දු - ලංකා ගිවිසුම' අත්සන් තබන ලදි. එම ගිවිසුමට අනුව ශ්‍රී ලංකාව තුළ නව ලක්ෂ හැත්තෑ පන්දහසක් ඉන්දීය දමිළ ජනතාව අදේශිකයන් ලෙස සිටින බව ගණනය කරන ලදි. ඔවුනතුරින් හය ලක්ෂයක් ඉන්දියාව භාරගන්නා බවට ද ඉතිරි තුන් ලක්ෂ හැත්තෑ පන්දහසක් ජනතාවට පුරවැසිභාවය ලබාදෙන බවට ද තීරණය විය. එහෙත් ශ්‍රී ලංකාවේ වෙසෙන අයට පුරවැසිභාවය ලබාදීමටත් වඩා ඔවුන් ආපසු ඉන්දියාවට හරවා යැවීම, ලංකාණ්ඩුවේ ඉලක්කය වී තිබූ හෙයින් එම ගිවිසුම ක්‍රියාත්මක තලයට ගෙන ඒමේ දී නොයෙකුත් අර්බුද හටගෙන තිබුණි. (any person to whom the Agreement of

සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ලාල් බහදූර් ශාස්ත්‍රී

1964 applied to, could make an application to be granted citizenship of Sri Lanka, by registration)

මෙලෙස 1964 දී ගිවිසුම ක්‍රියාත්මක නොවූ තත්ත්වය තුළ 1974 දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ඉන්දිරා ගාන්ධි අතර ද ඉන්දු - ලංකා ගිවිසුමක්' අත්සන් තබන ලදී. එම ගිවිසුමට අනුව පෙර තීරණය කළ සංඛ්‍යාවෙහි වෙනසක් සිදුවිය. කෙසේ වෙතත්, ක්‍රම ක්‍රමයෙන් බලහත්කාරයෙන් ශ්‍රී ලංකා වාසී ඉන්දීය දමිළ ජනතාව විශාල සංඛ්‍යාවක් ඉන්දියාව බලා පිටත්වූහ. එම ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබාගැනීම සඳහා අයදුම් කිරීමට ලබා දී තිබූ කාලය 1981 වසරේ දී අවසන් විය.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ඉන්දිරා ගාන්ධි

1986 වන විට ශ්‍රී ලාංකික දමිළ ජනතාව වෙනම රටක් ඉල්ලා ආරම්භ කළ අභ්‍යන්තර ආරවුල් තීව්‍රවීමත් සමග අදේශික දමිළ ජනතාවට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාදිය යුතු යැයි තිම්පු (භූතානය) සාකච්ඡාවේ දී දමිළ ජනතාවගේ පාර්ශවයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. මේ පසුබිම තුළ 1986 අංක 5 දරන අදේශිකයින්ට පුරවැසිභාවය ලබාදීමේ පනත ශ්‍රී ලංකාවේ දී සම්මත විය. මෙම පනත 1988 දී යළි සංශෝධනය කර ශීඝ්‍ර කරන ලදී. (Grant of Citizenship to Stateless Persons (Special Provisions & Act, No. 39 of 1988)

යුදමය වාතාවරණය හේතුකොට ගෙන ශ්‍රී ලංකා - ඉන්දීය නැව් ගමනාගමනයට බාධා පැමිණ තිබූ හෙයින් 1964 දී ගිවිසුම ප්‍රකාරව ඉන්දීය ගමන් බලපත්‍ර ලබාගෙන තිබුණ ද ඉන්දියාවට යාමට නොහැකිව ශ්‍රී ලංකාවේ සිටි අයටත් මින්මතු ඉන්දියාවට යාමට අවශ්‍ය නොමැති බව තීරණය කර 2003 අංක 35 දරන, ඉන්දීය සම්භවයක් ඇති පුද්ගලයන්ට පුරුවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත සම්මත කරන ලදී. (Grant of Citizenship to Persons of Indian Origin Act, No.35 of 2003)

1970 - 1990 කාල පරිච්ඡේදය තුළ උතුරුකරයේ විශේෂයෙන් වන්නියේ පදිංචි වූ ජනතාවට පුරවැසිභාවය යළි ලබාදීමට කටයුතු කළ අවස්ථාවේ දී එවකට පැවති යුදමය වාතාවරණය හේතුවෙන් ඊට අයදුම් කිරීමට නොහැකිවී තිබුණි. එමෙන්ම සරණාගත ජනතාව හැටියට ඔවුන්ට තමිල්නාඩුව බලා යාමටත් සිදුවිය. සරණාගතයින් හැටියටත් අදේශික පුද්ගලයන් හැටියටත් සරණාගත කඳවුරුවල වාසය කරනුයේ එම ජනතාවයි.

2008 දී ඉන්දියාව බලා ගිය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවට සම්පූර්ණයෙන් කඳවුරු 117ක 95,218 දෙනෙකු සරණාගතයින් හැටියට ජීවත්වන බවත් අදේශික පුද්ගලයින් හැටියට ශ්‍රී ලාංකික සරණාගතයින් 28,489 දෙනෙකු සිටින බවත් හඳුනා ගැනීමට හැකි විය. ඉන්දියාව සඳහා වූ චෙන්නායි හි ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය තානාපති පාර්ලිමේන්තු කමිටුවට ඒ බව වාර්තා කරන ලදී.

ඒ අනුව 2009 දී මෙම පනත අදේශික (රාජ්‍ය විරහිත) පුද්ගලයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතට (1988) සංශෝධනයක් එක් කර Grant of Citizenship to Stateless Persons (Special Provisions) Act, No.05 of 2009 යනුවෙන් සංශෝධිත පනතත්, 2009 අංක 6 දරන, ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනතත් (Grant of Citizenship to Persons of Indian Origin (Amendment) Act, No.6 of 2009) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී ඒකමතිකව සම්මත කරන ලදී.

ඉහත විස්තර කර ඇත්තේ ඉන්දියානු සම්භවයක් ඇති ශ්‍රී ලාංකික පුද්ගලයින්ගේ පුරවැසිභාවය උදුරා ගැනීම හා යළි ලබාදීම පිළිබඳ කෙටි ඉතිහාසයයි.

මෙම කෙටි ඉතිහාසය තුළ අවධානයට ලක් වූ කරුණ නම්, 1948 පුරවැසි පනත (Citizenship Act, No.18 of 1948) කඳුකරයේ දමිළ ජනතාවගේ පුරවැසිභාවය උදුරා ගැනීමට සමත්වූ හෙයින්, 1949 සිට ඡන්ද බලය ද ඔවුන්ට අහිමි විය. (Ceylon Parliamentary Elections (Amendment) Act, No. 48 of 1949 stipulated citizenship as a requirement to vote. Indian Tamils, not considered citizens as per the 1948 and 1949 Acts, were disenfranchised) ඉක්බිතිව, එම ජනතාව සඳහා 1986 දක්වා විටින් විට පුරවැසිභාවය ලබාදෙන ලදී. විශාල සංඛ්‍යාවකට යළි පුරවැසිභාවය ලබාදෙනු ලැබුවේ, 1986න් පසුවයි. 1948 පුරවැසි පනත නම් පනතක් මගින් එය උදුරාගෙන එය නැවත ලබාදෙන ලද්දේ නොයෙකුත් පනත් හා ගිවිසුම් යටතේ ය. 1931 සිට 1948 දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන් හැටියට සලකනු ලැබූ ජනතාව විවිධ බලපෑම්වලට ලක්වූ බව එම පනත්වල නම්වලින් ම විද්‍යමාන වේ.

1. 1949 අංක 3 දරන, ඉන්දියා - පකිස්තාන පදිංචිකරුවන්ගේ පුරවැසි පනත (India Pakistan Residents Citizenship Act. No 3 of 1949)

2. 1954 දී එවක ඉන්දීය අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ජනපති කොතලාවල මැතිතුමා අතර අත්සන් තබන ලද ඉන්දු - ලංකා ගිවිසුම (Indo-Ceylon Agreement of 1954 Nehru - Kotelawala Pact)
3. 1964 දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ලාල් පහදූර් ශාස්ත්‍රී මැතිතුමා අතර අත්සන් තබන ලද ඉන්දු - ලංකා ගිවිසුම (Indo-Ceylon Agreement of 1964 (Sirima-Shastri Pact)
4. 1974 දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ ඉන්දීය අග්‍රාමාත්‍ය ඉන්දිරා ගාන්ධි මැතිනිය අතර ඇති කර ගත් ඉන්දු - ලංකා ගිවිසුම. (Indo-Ceylon Agreement of 1974 (Sirima - Indira Pact)
5. 1986 අංක 5 දරන, අදේශික (රාජ්‍ය විරහිත) පුද්ගලයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (Grant of Citizenship to Stateless Persons Act, No. 5 of 1986)
6. 1988 අංක 5 දරන, අදේශික (රාජ්‍ය විරහිත) පුද්ගලයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත (Grant of Citizenship to Stateless Persons - Amendment & Act, No. 5 of 1986)
7. 2003 අංක 35 දරන, ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (Grant of Citizenship to Persons of Indian Origin Act, No. 35 of 2003)
8. 2009 අංක 5 දරන, අදේශික (රාජ්‍ය විරහිත) පුද්ගලයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත (Grant of Citizenship to Stateless Persons (Amendment) Act, No. 5 of 2009)
9. 2009 අංක 6 දරන, ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත (Grant of Citizenship to Persons of Indian Origin (Amendment) Act, No. 6 of 2009)

1949 සිට 2009 දක්වා දශක 6ක කාලය තුළ අදියරෙන් අදියර ප්‍රදානය කරන ලද කිසිඳු පුරවැසි පනතකින් කඳුරට දමිළ ජනතාව ශ්‍රී ලංකා පුරවැසියන් හැටියට සංකේතවත් කිරීමට හෝ පිළිගැනීමට ලක් කිරීමට විධිවිධාන සලසා නොතිබුණි.

1949 දී හුවා දක්වා තිබුණේ ඉන්දියා - පකිස්තාන පදිංචිකරුවන් බවට ය. 1954, 1964, 1974 යන වර්ෂයන්හි දී අත්සන් තබන ලද ගිවිසුම්වල ඉන්දියානුවන් බවට සංකේතවත් කර ඔවුන් ආපසු ලබාගත යුතු බවට අදහසක් පළ කර තිබුණි. ඉක්බිතිව 1986, 1988 වර්ෂයන්හි දී මෙම ජනතාව අදේශික (රාජ්‍ය විරහිත පුද්ගලයන්) ලෙස හඳුන්වාදී තිබුණි. ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් හැටියට 2003 හා 2009 දී හඳුන්වා දී තිබුණි. ශ්‍රී ලංකාවේ ජනගහණය පිළිබඳ සංගණනයේ දී දැනුදු ඔවුන් හුවා දක්වනු ලබනුයේ 'ඉන්දීය දමිළ' යනුවෙනි.

මෙම ජනතාව මෙතෙක් ශ්‍රී ලංකික පුරවැසියන් බවට මුළුමනින්ම පිළිගෙන නොමැති බවට මේවා සාක්ෂි වේ.

හුදෙක් නීතියෙන් පමණක් නොව මූලික අයිතිවාසිකම් පවා ප්‍රතික්ෂේප වන බැවින් ද ඔවුන් තවමත් මුළුමනින්ම ශ්‍රී ලාංකික පුරවැසියන් බවට පිළිගැනීමට ලක්ව නොමැත.

ඉඩම් අයිතිය පමණක් නොව නිවාස අයිතිය ද ප්‍රතික්ෂේප වූ පුරා වසර 40ක් ගතවීමෙන් පසු නිදහස් අධ්‍යාපන ක්‍රමය තුළට ඇදාගනු ලැබූ තවමත් මූලික සෞඛ්‍ය පහසුකම් සඳහා රජයේ අනුමත ග්‍රාමීය රෝහල්වල සෞඛ්‍ය පහසුකම් හිමි නොවූ එහෙත් ඒ වෙනුවට වතු පරිපාලනයට යටත් වතු රෝහල්වල සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට සිදු වී ඇති, පිරිසිදු පානීය ජලය නොලැබෙන, රටේ අභ්‍යන්තර පරිපාලනයට මුළුමනින්ම ඇතුළත් නොවූ සහ සිය තැපැල් ලිපිනය පවා ලබා ගැනීමට නොහැකි ජන කොට්ඨාසයක් වශයෙන් ඔවුන්ට ජීවත්වීමට සිදු වී ඇත.

2022 වසරේ දී ශ්‍රී ලංකාවට සපැමිණි සමකාලීන වහල්භාවය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු මහාචාර්ය ටොමෝයා ඔබෝකාටා (UN Special Rapporteur on contemporary forms of slavery, Prof. Tomoya Obokata) මහතා වැවිලි ප්‍රදේශවල ජීවත්වන ජනතාව (99%ක්වූ දමිළ ජනයා) තවමත් අර්ධ වශයෙන් වහල්භාවයේ සිටින බව වාර්තා කර ඉහතින් විස්තර කළ කරුණු සනාථ කර තිබේ.

මහාචාර්ය ටොමෝයා ඔබෝකාටා

එබැවින් පුරවැසිභාවය උදුරාගැනීමට ලක්වීම හේතුකොටගෙන ඡන්ද බලය අහිමි වූ කඳුරට දමිළ ජනතාව ඡන්ද බලයේ වේදනාකාරී තත්වය හා එහි ප්‍රබලතාව ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලංකාව තුළ ජීවත්වෙමින් සිටිති. අයිතිවාසිකම් දිනාගත හැකි වනුයේ ඡන්ද බලය පාවිච්චි කිරීමෙන් පමණක් බව සිතා මැතිවරණවල දී සාපේක්ෂව රටේ සෙසු පළාත්වලට වඩා වැඩි ප්‍රතිශතයකින් ඔවුහු ඡන්දය පාවිච්චි කිරීම ද මෙහි දී අවධානයට ලක්විය යුතු කරුණකි.

තෙවන මැතිවරණ කොමිෂන් සභාව

2022 ඔක්තෝම්බර් මස 31 වන දින සම්මත කරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත තෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදි. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා ද සාමාජිකයින් ලෙස එම්.ඒ.පී.සී. පෙරේරා මහතා හා අමීර් ෆායිස් මහතා 2023.07.05 දින ද අනුසූයා ෂන්මුගනාදන් මෙනවිය 2023.09.12 දින ද රාජකාරි ආරම්භ කරන ලදී.

ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති

ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධරයෙක් වේ. 1985 වර්ෂයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් ව 1986 වර්ෂයේ සිට සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස ත්‍රිකුණාමලය, නුවරඑළිය, පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ද අනතුරුව නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සේවය කොට 2011 වර්ෂයේ දී පළාත් පාලන මැතිවරණ අංශයේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් පත් විය. පසුව මැතිවරණ කොමිෂන් සභාවේ පළමු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් පත්වූ ඒ මහතා මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ වසර 33කට වැඩි සේවා කාලයක් ඇති අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකි.

එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික

කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ උපාධිධරයෙකු වන එම්.ඒ.පී.සී. පෙරේරා මහතා 1985 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් ව 1986 වර්ෂයේ සිට සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස පොළොන්නරුව හා කෑගල්ල දිස්ත්‍රික්ක මැතිවරණ කාර්යාලවල ද අනතුරුව ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා ලෙස හා ගම්පහ සහා රත්නපුර දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ද, සේවය කොට මැතිවරණ මහලේකම් කාර්යාලයේ පාර්ලිමේන්තු මැතිවරණ අංශයේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස ද පත්ව ඇත. අනතුරුව මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරයට පත් වූ ඒ මහතා මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ වසර 33කට වැඩි සේවා කාලයක් ඇති අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකි.

අමීර් ෆායිස් - සාමාජික

නීතිඥ අමීර් ෆායිස් මහතා 1990 වර්ෂයේ නීතිඥ වෘත්තිය අරම්භ කරන ලද අතර 2010 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය (LLM) ලබා ඇත. එමෙන් ම සාමය හා ආරක්ෂාව පිළිබඳව සහ පෙඩරල්වාදය, විමධ්‍යගතකරණය හා විවිධත්වය පිළිබඳ විදේශ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යාපනය ලත් ඩිප්ලෝමාධාරියෙකි. තවද සිවිල්, ව්‍යවස්ථා කටයුතු හා මානව හිමිකම් පිළිබඳ කටයුතුවලට සක්‍රීයව දායක වී ඇත. එමෙන් ම දේශපාලන පක්ෂ සහ සිවිල් සාමාජීය ආයතනවල ප්‍රතිපත්ති සම්පාදනය දිරිගැන්වීමට කටයුතු කර ඇත. විවිධ රාජ්‍ය නොවන ආයතනවල සභාපති, සාමාජික, උපදේශක තනතුරු හෙබවූ අත්දැකීම් සහිත පළපුරුදු නීතිඥවරයෙකි.

අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික

නීතිඥ අනුසූයා ෂන්මුගනාදන් මෙනවිය 1981 වර්ෂයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක වශයෙන් දිවුරුම් දීමෙන් පසුව 1984 වර්ෂයේ නීතිපති දෙපාර්තමේන්තුවේ සහකාර රාජ්‍ය නීතිඥයෙකු වශයෙන් රාජකාරි ආරම්භකොට ඇත. පසුව ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ, රාජ්‍ය නීතිඥ, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ, ලෙස වසර 32ක කාලයක් සේවය කර ඇති අතර විශේෂයෙන් අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් උල්ලංඝන නඩු පිළිබඳ කටයුතු කර ඇත. අනතුරුව වර්ෂ 2020 සිට 2023 වර්ෂයේ මැද භාගය දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක වශයෙන් කටයුතු කර ඇති අතර ඒ.ෂන්මුගනාදන් මෙනවිය එංගලන්තයේ හා වේල්ස්හි සොලිසිටර්වරියක ලෙස ද ක්‍රියාකර ඇති අත්දැකීම් බහුල නීතිඥවරියකි.

උපදේශක මණ්ඩලය
ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති
එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික
අමීර් ෆායිස් මහතා - සාමාජික
අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

සංස්කරණය
චන්න පී. ද සිල්වා
(අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
පරිගණක පිටු සැකසුම
අමිල ගමගේ (මැතිවරණ කොමිෂන් සභාව)
මුද්‍රණය
රජයේ මුද්‍රණාලය
ප්‍රකාශනය
නීති, විමර්ශන හා සැලසුම් ශාඛාව,
මැතිවරණ කොමිෂන් සභාව

ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න
සංස්කාරක
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka

මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ. මෙහි ඇතුළත් කරුණු, උපුටා පළ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.